unicef for every child

මාධ්‍ය නිවේදනය

## ළමුන්ගේ රැකවරණ ප්‍රතිසංස්කරණ සඳහා වන ගෝලීය ප්‍රඥප්තියට කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබීම සම්බන්ධයෙන් යුනිසෙෆ් ශ්‍රී ලංකා නිවේදනය

**කොළඹදී, 2026** මැයි **7** වැනිදා -ළමුන්ගේ රැකවරණ ප්‍රතිසංස්කරණ සඳහා වන ගෝලීය ප්‍රඥප්තියට මැයි 4 වැනිදා කැබිනට් අනුමැතිය ලැබීම, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF/යුනිසෙෆ්) පිළිගන්නා අතර එය ළමයින්ගේ ආරක්ෂාව ශක්තිමත් කරන සහ ශ්‍රී ලංකාවේ ජාතික විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යෑමට රුකුලක් වන සන්ධිස්ථානීය තීරණයකි.

දරුවන්ගේ රැකවරණය සම්බන්ධයෙන් කෙරෙන ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යෑම සඳහා යුනිසෙෆ් වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකා රජය සමඟ සමීපව කටයුතු කර ඇත. ජාතික විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ගොඩනැඟීම සඳහා ලබා දුන් සහාය, නේවාසික සත්කාර ආයතනවල ජාතික සංගණනය ක්‍රියාත්මක කිරීමට ලබා දුන් සහාය සහ, 2018 වසරේ සිට ආයතනගතව සිටින දරුවන්ගේ සංඛ්‍යාව සියයට 30ක් දක්වා අඩු කිරීමට හේතු වූ පළාත් ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනයට සහාය වීම යනාදිය ඊට ඇතුළත් වේ. පසුගිය වසර පහ ඇතුළත ළමයින් 6,000කට අධික ප්‍රමාණයක් ආයතනවලට ඇතුළත් වීම අපගේ මෙම සහාය තුළින් වළක්වා ඇති අතර, ළමයින් 2,000ක් පමණ නැවත ඔවුන්ගේ පවුල් සමඟ එක් කර ඇත. නායකත්වය සහ හවුල්කාරීත්වය, නිවැරදි දත්ත සහ තොරතුරු සමඟ සම්බන්ධ වූ විට කළ හැකි දේ මෙම ජයග්‍රහණවලින් හොඳින් පෙන්නුම් කෙරේ.

එහෙත්, මෙරට දරුවන් 8,000කට වැඩි පිරිසක් තවමත් නේවාසික රැකවරණ තුළ හැදී වැඩෙන අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුගේ මව හෝ පියා ජීවත්ව සිටියි. දරිද්‍රතාවය, ප්‍රචණ්ඩත්වය සහ අපයෝජනය, සමාජ අපකීර්තිය, හා ප්‍රජා-පාදක සේවාවන්හි අඩුලුහුඩුකම් මෙවන් ආයතනගත කිරීම් තුළින් දැක්වේ. මෙම ගෝලීය ප්‍රඥප්තිය මෙවන් සමාජ ගැටළු විසඳීම සඳහා භාවිතා කළ හැකි වටිනා ව්‍යුහයකි. එහි අඩංගු ප්‍රතිපත්ති - එනම් අනවශ්‍ය මාපිය-දරු වෙන් කිරීම්, පවුල්-පාදක කරගත් රැකවරණයට මුල්තැන දීම සහ ආයතනගත කිරීමෙන් බැහැර වීම - දැනට ශ්‍රී ලංකාවේ ජාතික විකල්ප රැකවරණ ප්‍රතිපත්තියට සිදුකරගෙන යන ප්‍රතිසංස්කරණ සමඟ හොඳින් යා වේ.

දරුවන්ගේ රැකවරණය සුරක්ෂිත කිරීම සඳහා ප්‍රතිපත්ති අත්‍යවශ්‍ය සාධක වුවද, සැබෑ වෙනස රඳා පවතින්නේ ඒ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නිසි ලෙස යෙදවීමෙන් සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය මතයි. එමෙන්ම සිද්ධි කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම, පවුල් සඳහා ඇති උපකාරක සේවා පුළුල් කිරීම වැනි පියවර තුළින්ද සෑම දරුවෙක්ම ආරක්ෂිත පවුල් පරිසරයක හැදී වැඩීමට හැකි බව සහතික කිරීම ද මේ සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම ප්‍රතිපත්තීන් දරුවන්ගේ තිරසාර යහපත සඳහා යෙදවීමට හැකි සහාය, රජය, පළාත් බලධාරීන් සහ සිවිල් සමාජ පාර්ශවකරුවන් වෙත ලබාදීමට යුනිසෙෆ් හි අපි සූදානමින් සිටිමු.

###

වැඩිදුර විස්තර සඳහා සම්බන්ධ වෙන්න:
බිස්මාර්ක් ස්වාන්ගින්|යුනිසෙෆ් ශ්‍රී ලංකා| +94 777236548 | bswangin@unicef.org
ලක්නා පරණමාන්න| යුනිසෙෆ් ශ්‍රී ලංකා | +94 776783352 | lparanamanna@unicef.org

යුනිසෙෆ් ගැන:
ලෝකයේ වඩාත්ම අවාසි සහගත දරුවන් වෙත ළඟා වීමට යුනිසෙෆ් සංවිධානය ලෝකයේ දුෂ්කරම ස්ථානවල සේවය කරයි. රටවල් සහ ප්‍රදේශ 190 කට වැඩි ගණනක, අපි සෑම දරුවෙකුටම, සෑම තැනකම, සෑමට වඩා හොඳ ලෝකයක් ගොඩනැඟීමට කටයුතු කරමු. ශ්‍රී ලංකාවේ යුනිසෙෆ් ආයතනයේ කටයුතු පිළිබඳ වැඩි විස්තර සඳහා, පිවිසෙන්න: https://www.unicef.org/srilanka/